**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

# රාජ්‍ය නැටුම් කණ්ඩායමේ නැටුම් ශිල්පී තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

01. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නැටුම් කණ්ඩායමේ පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත දැක්වෙන සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් 2020.10.09 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

    එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලදඅයදුම්පත් පමණක් එවිය යුතුය.

04. මෙම තනතුර සඳහා අයදුම්පත් එවීමේදී, අයදුම් කරනු ලබන තනතුර "නැටුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් අයදුම්පත්" බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. අයදුම්පත් පිරවීමේදී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුලත් කළ යුතුය.

06. සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි :
    - i. කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලබන අතරවසර 03ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්කෙරේ.
    - ii. වැටුප රු.33,600/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :
    - i. අධ්‍යාපන සුදුසුකම් :

      අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව නර්තන විෂය ඇතුළුව විෂයන් හයක් (06) සමත් වීම. **හා**

      ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වනු ලබන නර්තන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා සමත්ව තිබීම. **හෝ**

      රජය විසින් පිළිගනු ලබන නර්තන විෂය සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම. **හෝ**

      ජාතික නැටුම් ප්‍රාරම්භක විභාගය සමත්වීම.
    - ii. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

      (යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)
    - iii. පළපුරුද්ද :

      රජයේ අනුමත කලායතනයක හෝ ඊට සමාන ආයතනයක නැටුම් ශිල්පියෙකු වශයෙන් වසර 03ක පළපුරුද්ද. **හෝ**

      පාරම්පරික නර්තන ශිල්පියකු වීම. (ලිඛිතව සනාථ කළ යුතුය)
    - iv. කායික සුදුසුකම් :
        - i. සෑම අපේක්ෂකයෙකුම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
        - ii. උස අඩි 5 යි අඟල් 2 කට නො අඩු විය යුතුය.
    - V. වෙනත් සුදුසුකම් :
        - i. සියලුම අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
        - ii. තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
        - iii. නර්තන / වාදන සියලුම අංශවල ප්‍රවීණතාවය සලකනු ලැබේ.

08. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 25 ට නොවැඩි විය යුතුය.

09. බඳවා ගැනීමේ ක්‍රමය :
    - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.
    - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩුසංඛ්‍යාවමෙන්දෙගුණයක්වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් සහ වෘත්තීය පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 2. අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය ) | 35 | |
| 3. වෘත්තීය සුදුසුකම්<br>i. ප්‍රවීණ ශිල්පීන් යටතේ ජාතික තලයේ නිර්මාණවලට සහභාගී වී තිබීම.<br>ii. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් හෝ ප්‍රවීණ ශිල්පීන් සමගින් විදේශ ප්‍රසංගවලට සහභාගී වී තිබීම. | 25 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

**වෘත්තීය පරීක්ෂණය**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ශිල්පීය දක්ෂතාව | 30 | 15 |
| 2. රේඛා හැඩතල සහ තාල ඥණය | 20 | 10 |
| 3. පෙනුම (උස/මහත) | 20 | 10 |
| 4. විශේෂ කුසලතා | 20 | 10 |
| 5. න්‍යායාත්මක දැනුම | 10 | 05 |
| එකතුව | 100 | 50 |

**අධ්‍යක්ෂ,**
**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,**
**08 වන මහල,සෙත්සිරිපාය, බත්තරමුල්ල.**
**2020.09.20**

## ආදර්ශ අයදුම් පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නැටුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා ඉල්ලුම් කිරීම**

1. මුලකුරු සමග නම : ..................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ..................
3. උපන් දිනය : ..................
4. වයස (2020.10.09 දිනට) : ..................
5. උස : අඩි .................. අඟල් ..................
6. ජාතික හැඳුනුම්පත් අංකය : ..................
7. ස්ත්‍රී / පුරුෂ භාවය : ..................
8. ලිපිනය : ..................
9. දුරකථන අංකය : ..................
10. අධ්‍යාපන සුදුසුකම් : ..................

    i. අ.පො.ස. (සා/පෙළ)

    වර්ෂය : විභාග අංකය :

| විෂය | ලබාගත් සාමාර්ථය | විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වනු ලබන නර්තන ඩිප්ලෝමා පාඨමාලාව/ රජය විසින් පිළිගනු ලබන නර්තන විෂය සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාව/ ජාතික නැටුම් ප්‍රාරම්භක විභාගය

| වලංගු වන දිනය | සමත් විභාගය | ආයතනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් : ..................
12. පළපුරුද්ද : ..................

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති සියලු තොරතුරු මාදන්නාතරමින් සත්‍ය හා නිවැරදි බවද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

දිනය : .................. අයදුම්කරුගේ අත්සන : ..................

Source: Silumina, Sunday Observer (2020.09.20)